

# යාපනයෙන් ඇසුණු කවි

සෝමසුන්දරම්පිල්ලෙයි පද්මනාදන්ගේ දෙමළ කවි විසිහයක
සිංහල පරිවර්තනය

පරිවර්තනය

**කුන්දිශ් ඕෂධ**

**කනිෂ්ක මහේන්ද්‍ර විජයරත්න**

සංස්කරණය

**මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර**



# යාපනයෙන් ඇසුණු කවි

සෝමසුන්දරම්පිල්ලෙයි පද්මනාදන්ගේ දෙමළ කවි විසිහයක

සිංහල පරිවර්තනය

**පරිවර්තනය**

කුන්දිශ් ඕෂධ

කනිෂ්ක මහේන්ද්‍ර විජයරත්න

**සංස්කරණය**

මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර

**යාපනයෙන් ඇසුණු කවි: සෝමසුන්දරම්පිල්ලෙයි පද්මනාදන්ගේ දෙමළ කවි විසිහයක සිංහල පරිවර්තනය**

---

© මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර
**කුන්දිශ් ඕෂධ**
**කනිෂ්ක මහේන්ද්‍ර විජයරත්න**

---

ISBN 978-624-5703-21-0

---

**ප්‍රථම මුද්‍රණය: 2022**

---

**මුහුණතේ හිමිකම සහ පිටු සැකසුම**
කනිෂ්ක මහේන්ද්‍ර විජයරත්න

---

**ප්‍රකාශනය**

මානව විද්‍යා අධ්‍යයනාංශය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

---

යුද්ධයෙන්

මේ දූපතේ

මිහිදන් වී සැඟ ව ගිය

සිංහල

දෙමළ

මුස්ලිම්

බර්ගර්

සුවහසක් ශ්‍රී ලාංකේය

පුරවැසියන්ට

මේ ගත

පූජා වේ වා!

# පූර්විකාව

මේ ජාතික සමගිය පසක් කිරීම අරමුණු කරගනිමින් ශ්‍රී ලාංකේය දෙමළ සංස්කෘතිය චිත්‍රණය කරලන කවි විසිහයක සිංහල පරිවර්තනයකි. සෝමසුන්දරම්පිල්ලෙයි පද්මනාදන් නම් වූ කවියා විසින්, පරිවර්තකයා විසින් යාපනය පදනම් කරගනිමින් නිර්මාණය කරන ලද මේ කවි තුළින් උතුරේ ජීවිතය, දෙමළ සංස්කෘතිය, පවුල් සබඳතා, මානව ධර්මතා ආදි නේක පැතිකඩයන් විද්‍යමාන වෙයි. අප උත්සාහ කළේ එකී ජීවිතයට තරමක් දුරකට හෝ සමීප වෙමින් එහි ඇති අපූර්වත්වය, අව්‍යාජත්වය තේරුම් ගැනීමට ය. 'සෝපා' විසින් ලියන ලද කවි ගොන්නෙන් ඉතා සුළු ප්‍රමාණයකි මෙසේ සිංහලයට පරිවර්තනයට වන්නේ. මෙහි බොහෝ කවි තුළ ඇත්තේ කතන්දරයන් ය. ඒ කතන්දර තුළින් පළට වන්නේ උතුරේ දෙමළ ජනයාගේ ජීවිතය යි; සංස්කෘතිය යි.

විවිධ තේමාවන්ගෙන් පරිවර්තනය කරන ලද මෙම කවි සංස්කරණය කරනු ලැබුවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා ය. එමෙන් ම මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ද මානව විද්‍යා අධ්‍යයනාංශයේ ශාස්ත්‍රීය මෙහෙවරෙහි එක් කොටසක් වන ජාතික සමගිය ගොඩනැගීමේ කර්තව්‍යය ප්‍රකට කරමිනි.

මෙම කෘතිය සඳහා සිය කවි ලබා දෙමින් සහාය වුණු සෝමසුන්දරම්පිල්ලෙයි පද්මනාදන් මහතාට අපගේ ගෞරවනීය ස්තුතිය හිමි වන අතර එය ප්‍රකාශයට පත් කිරීමෙහි ලා ඉදිරිපත් වුණු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ මානව විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානී මහාචාර්ය චාමලී නහල්ලගේ මහත්මියටත් අපගේ කෘතඥතාව හිමි වේ. ''විවාහයේ පරමානන්දය'' හිසින් යුත් පරිවර්තිත පද්‍යය ලබා දුන් ප්‍රවීණ ලේඛක දයා දිසානායක මහතාටත් අපගේ ස්තුතිය පිරිනැමේ. ගුණ දොස් වෙනුවෙන් සහෘද ඔබට ඉඩ දෙමින් යාපනෙන් ඇසුණු කවි ඔබට මෙසේ පුදමු.

කතුවරුන්
2022 මැයි 12 වන දා,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී ය.

# සිංහල මුද්‍රණයට වචනයක්

මම පාසලේ උසස් පන්තිවල ඉගෙනගන්නා නව යොවුන් අවධියේ සිට ම කවි ලීවෙමි. සමාජ තේමාවන් ආමන්ත්‍රණය කිරීමට සාම්ප්‍රදායික දමිළ පද්‍ය ආකෘතීන් භාවිත කළෙමි. මා රාජ්‍ය සේවයට බැඳී කොළඹ පදිංචියට යන විටත් මේ ගුණය මා තුළ තිබුණි. ***තිනකරන්*** මගේ වේදිකාව විය. ගුරුවරයකු වීමට තීරණය කිරීමෙන් පසු මුතූර් දිස්ත්‍රික්කයේ කටයුතු කළෙමි. මා ලේඛන කටයුතු බොහොමයක් සිදු කළ අතර මගේ කවි පළ වූයේ ***තිංපති, චින්තාමනී*** වැනි (දවස සමූහයේ) සංග්‍රහයන්වල ය.

වර්ෂ 1974 දී යළි මම යාපනයට පැමිණි අතර උපාධිය ලැබීමෙන් පසු පලාලි ගුරු විද්‍යාලයේ කථිකාචාර්යවරයකු බවට පත් වුණෙමි. අසූව දශකයේ දී කවි කියැවීම ජනප්‍රිය විණි. යාපනය පුරාවට පැවැත්වුණු බොහෝ සාහිත්‍ය උත්සවවලට මගේ කවි ඉදිරිපත් කළෙමි.

වර්ෂ 1983න් පසු දශක දෙක තුළ ජනවාර්ගික අර්බුදය සන්නද්ධ ගැටුමක් කරා වර්ධනය විය. දුර්භික්ෂ සමයේ දී ප්‍රචණ්ඩත්වය, අවතැන්වීම් සහ දිවි බේරා ගැනීමට මා සාක්ෂි දරමින් සිටිනු ලැබී ය. මා එහි කොටසක් විය. මගේ කවිය යුද්ධයේ විනාශය පිළිබිඹු කරන්නකි.

මිනිසුන් දහස් ගණනින් රටින් පිටමං වන කල, මම රැඳී සිටීමට තීරණය කළෙමි. 2002 වසරේ සටන් විරාමය අපට බලාපොරොත්තුවක් ලබා දුන් අතර, මා විසින් දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද සිංහල කවීන්ගේ කවි එකතුවක් වන ***'තෙනිලංකායි කවිතායි'*** මම ප්‍රකාශයට පත් කළෙමි. ඊට යහපත් ප්‍රතිචාර ලැබුණි. නමුත් මගේ කවි සිංහලයට පරිවර්තනය කරගැනීමේ සිහිනය සැබෑ වූයේ නැත. මේ අතරතුරේ ප්‍රවීන ලේඛක දයා දිසානායකට ස්තුතිවන්ත වන්න දිල්ලි, අග්‍රා සහ ජෙයිපූර්වල වාර්ෂික ව පැවැත්වෙන සාක් සාහිත්‍ය උලෙළට සහභාගී වීමට මට ආරාධනා ලැබුණි. එහි දී මට ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා හමුවිණි. ඔහු මගේ කවි සිංහලයට පරිවර්තනය කිරීමට කැමැත්ත පළ කළ නමුදු ඔහු සිය ශාස්ත්‍රීය කටයුතු හේතුකොටගෙන අධික ලෙස කාර්යබහුල විය. එහෙත් ඉකුත් මස මට දුරකථන ඇමතුමක් ලැබුණේ පරිවර්තනය අවසන් යන ශුභාරංචියත් සමගිනි.

මම අවුරුදු අටක් පමණ සිංහලයන් අතර ජීවත් වූ අතර ඔවුන් සමඟ ඉතා යහපත් සබඳතාවක් පවත්වා ඇත්තෙමි. පසුගිය දශක තුනක කාලය තුළ සිංහල සහ දෙමළ ජනතාව අතර සන්නිවේදන බිඳවැටීම ගැන මම කනගාටු වෙමි. සිංහල දෙමළ ජනතාව සුහද ව ජීවත් වන්නේ නම් ශ්‍රී ලංකාව ලෝකයේ සතුටින් ම සිටින රට වනු ඇත. මෙම එකතුව මගේ සිංහල සහෝදරයන් වෙත ළඟා වීමට ගත් නිහතමානී උත්සාහයකි.

අවසාන වශයෙන් මෙම කටයුත්ත භාරගත් ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාට මාගේ ස්තුතිය පුද කරන අතර දයා දිසානායකට සහ ප්‍රකාශකයන්ටත් ස්තුතිය පළ කරමි.

එස්. පද්මනාදන් (සෝපා),
59/13, පොට්පාති පාර,
කොකුවිල්.
e-mail: spathma149@gmail.com

# පටුන

1. සුවිහාරම් - 1
2. වරදකාරී හැඟීම - 3
3. යොදය සොරකම් කරන්නා - 4
4. සින්න මාමා - 6
5. ප්‍රීතිමත් ප්‍රතිසංගමයක් - 8
6. අම්මාගේ පුත්‍රයන් - 10
7. සිරුරේ ඇනී ඇති කටුවක් - 12
8. ලොකු අප්පුගේ සාළුව - 14
9. නවෝත්පාදක - 16
10. මූලයන් සොයා - 18
11. හූලන් - 20
12. සුයම්වරම් - 22
13. වෛදූරියම් - 24
14. දිව්‍ය නිරුවත -26
15. හරිත තණබිම් - 28
16. උතුරුකරයේ ජීවිතය - 31
17. මිදීම - 32
18. පුර පෝයක සිතුවිලි - 35
19. කර්ම - 39
20. අපේ කාලය පිළිබඳ ප්‍රවේශම් වන්න (කෙටි කවි හතක්) - 41
21. අතරින් බලන්න - 44
22. දණ්ඩනය - 46
23. හංවඩු ගැසීම - 48
24. මයිලර් - 50
25. අන්තිම පලාලය - 52
26. විවාහයේ පරමානන්දය - 54

# සුවීහාරම්[1]

මාගේ බාල සහෝදරයා පැමිණියා

දහ අට මසකට පසු

අම්මාට දරාගන්නට නොහැකි වුණා

දැනටමත් සහෝදරයන් දෙදෙනකු සිටියා

අණ්ණම් මචාල්, මාමාගේ එක ම දියණිය

අවස්ථාව සලසා ගත්තා

ඇය මාව ප්‍රිය කළා

පැය ගණන් රැකබලා ගනිමින් කාලය ගත කළා

ලොකු අම්මා එම කතාව කීමට පුරුදු වී සිටියා

සවස් වෙද්දී අණ්ණම් පැමිණෙනවා

පොල් අතු වැටේ පොට්ටු හරහා

ඇය විහිළු-තහළු බෙදාගන්නවා

අවට අඳුරු වන විට

ඇගේ මුහුණ ද අඳුරු වනවා

ඔබේ මව මෙය තේරුම් ගන්නවා

රෙදිකඩකින් ඔතා

ඔබව භාර දෙනවා

කිරි පොවන බෝතලය ද සමඟ

පොට්ටු අතරින් රාත්‍රියට

ඔබව රැගෙන යන අණ්ණම් හට!

එම වැඩපිළිවෙළ සාර්ථක වූවා

ක්‍රමයෙන්, ඔබ හුරුබුහුටි දඟකාර කොල්ලෙකු ලෙස

උස්මහත් වන විට

අත් පා සතරෙන් ම බඩගාමින්

පොට්ටු හරහා

රාත්‍රියේ බැහැර ව යාම දිගට ම සිදුවුණා

ඒ ඔබ සාමාජිකයකු වූ නිසා

ඔබේ මාමාගේ පවුලේ!

[1]දරුකමට හදාගැනීම

# වරදකාරී හැඟීම

එවිට මට අවුරුදු හතයි

මව තීරණයක් ගත්තා

ඇය පියාගෙන් වෙන් වී

වෙනත් කෙනෙකු තෝරාගත්තා

ඇගේ දරුවන් රැගෙන ගියා

මාගේ තත්ත්වය වෙනස්

මා හැදුණේ තම සහෝදරිය අත්හළ

මගේ මාමා ළඟ

මා සිටියේ පාසලේ

මව අශ්ව කරත්තයකින් බැස්සා

ඇය මා වැළඳගෙන

ඇ සමග යාමට එන ගමන් ඉල්ලුවා

මා එය ප්‍රතික්ෂේප කළා

ඇය හඬමින් යන්නට ගියා

මාමා එම පුවත අසා සතුටු වුණා

ඔහු මා රැකබලා ගත්තා

මාගේ සහෝදරයන්ට නො ලැබුණු සැප පහසුකම් ලබාදුන්නා

මා ඔවුනට වඩා හොඳින් ඉගෙන ගත්තා

අද වන තුරු මා දන්නේ නෑ

මවගේ ආයාචනය ප්‍රතික්ෂේප කළේ ඇයි දැයි කියා

මා ඇයට ලබාදුන්නේ දඬුවමක් ද?

## යොදය සොරකම් කරන්නා

මව රැවටීමට පහසුයි

අහිංසක බවේ පුද්ගලාරෝපණය

නො හැකියි ඇයට අල්ලාගන්නට දඟකම් කරන්නන්

අරුල් අයියා වැනි!

ඔහු මව රැවටූ සැටි

ප්‍රසිද්ධ කතාවක් වූවා

අපේ ප්‍රදේශයේ

අරුල් අයියා එක ම පුතා

ලොකු අම්මාගේ

හත්දෙනෙකුගේ පවුලේ වැඩිමලා

සෙනෙහස දක්වන මාමලා නැන්දලාගේ ආදරයට ලක් වූ දරුවා

ඔහු මාගේ මවගේ සුරතලා

අපට එළදෙනුන් දෙදෙනකු සිටියා

පරිභෝජනය නො කළ කිරි

මුදවීමට යොමු වුණා

මව ගැටලුවකට මුහුණ දුන්නා

කිරි මිදුණේ නැහැ

එක් දහවලක
ඇගේ එළදෙනුන්ට
ආහාර සකසමින් සිටි මව
හදිසියේ මුළුතැන් ගෙට ගියා
අරුල් අයියා
නැවූ තල් ඉරටු දෙකක්
අතේ ඇති ව
ලිප මත තිබූ කිරි මුට්ටියෙන්
යොද තට්ටුව
මැනවින් ඔසවමින්
මුවට රුවා ගනිමින් සිටියා!

ඒ තමයි දවස්
ගෝපීන්ගෙන් වෙඬරු සොරාගත්
කුඩා ක්‍රිෂ්ණාගේ දඟකාරකම්
අසන්නට නො ලැබුණු!

# සින්න මාමා

මා කිසිදා සින්න මාමා ප්‍රිය කළේ නෑ
ඔහු ඉක්මනින් කේන්ති ගන්නවා
කිසිදා ඔහු සිනාසෙනවා මා දැක නෑ
කාරුණික වචනයක්?
නෑ, ඔහුගේ මුවින් කිසිදා පිට වූයේ නෑ!

ඔහු පිඟාන තල්ලු කර
තරහින් ඉවත් ව යනවා
හමුවුණොත් ඔහුට
හොද්දක ලුණු වැඩි වීමක්
ඔහු ධූර්වාසගේ අවතරණයයි!
කිසිදු කාන්තාවක් ඔහුට කැමති වුණේ නැහැ
ඒ නිසායි ඔහු තනිකඩ
මා එසේ සිතන්නට හුරු වී සිටියා
මා උස් මහත් වී
විවාහ වී දරුවන් ලැබූ පසු පවා
ඔහු මා ඇමතුවේ
'ඩා' ප්‍රත්‍යය යොදමින්
මෙලොව ඔහුට කැමති වන්නේ කවුද!

නෑ, එය එසේ නො වේ
ඔහුට බොහෝ මිතුරන් සිටියා

පවුල් සමූහයෙන් පිට
විශාල පිරිසක් දුටු පසු
ඔහුගේ අවමංගල්‍යයේ
මා සිතුවා මගේ විනිශ්චය වැරදි බව

ඇතැම් විට මාගේ පූර්ව විනිශ්චය ගැඹුරට යන්නට ඇති
එය පෙනෙනවාට වඩා
ලොකු අම්මා මා හට පවසා තිබූ කතාවකට
මාගේ මව ගර්භිණී ව සිටියා
මා තව මාසයකින් ලැබීමට නියමිත ව තිබුණා
සියලු සූදානම් කෙරෙමින් පැවතුණා
අපගේ පාරම්පරික නිවසේ
මාගේ සීයා, මූලපුරුෂයා
සින්න මාමාට ලබා දී රුපියල් දහයක්
එම කාලයේ වටිනා මුදලක්
ඖෂධ හා කුළුබඩු
මිල දී ගන්නා මෙන් පවසා තිබුණා
මාගේ මවගේ ප්‍රසූති කාලය සඳහා

සින්න මාමා නැවත පැමිණියේ නැහැ!
ඔහු ගම හැරදා කොළඹට ගොස් තිබුණා
හැමදාට ම නො වේ
වසරකට පසු ඔහු නැවත පැමිණි විට
මා මිදුලේ සෙල්ලම් කරමින් සිටියා!
ලොකු අම්මාගේ කතාව
ඇතැම් විට
මාගේ පූර්ව විනිශ්චයේ මූලයේ තිබෙන්නට ඇති!

# ප්‍රීතිමත් ප්‍රතිසංගමයක්

''බලන්න, අයියා එනවා!''

අප කිසිදා දැක තිබුණේ නැහැ අම්මා

එතරම් ප්‍රීතියෙන්

හේතුවක් නැති ව නොවේ

මාමා, ඇගේ සහෝදරයා, පැමිණෙමින් සිටියා

ඔහුගේ සැරයටියට බර වෙමින්

දකුණු පාදය ඉදිරියට අදිමින්

ඔහු වසරකට පෙර හෘදයාබාධයකට මුහුණ දුන්නා

එවිට ඔහුට පනස් අටයි

වසර පහළොවකින්

ඔවුන් එකිනෙකාට කතා කර තිබුණේ නැහැ

ඔවුන් අමනාප වුණා අම්මාගේ දික්කසාදය සහ

දෙවැනි විවාහය සමඟ

නමුත් සියලු දෙනා දැන සිටියා

අම්මා මාමාගේ ප්‍රියතම සහෝදරිය වූ බව

හෘදයාබාධයෙන් පසු

මාමාගේ සම්පත් හීන වී ගියා

සෞඛ්‍ය වියදම් හා ණය

ඔහුගේ පවුල තුළ ගැටලු ඇති කළා

එක් දිනයක

දැඩි කලකිරීමෙන්

නැන්දා යමක් පවසා තිබුණා

මාමාගේ හිත රිදෙන ආකාරයේ

ඔහු සැරයටිය රැගෙන

බසයකට නැගී අපගේ නිවසට පැමිණියා

පසුපසින් එන දරුවන් සමඟ

අම්මා මුළුතැන්ගෙයට ගියා

හොඳ සංග්‍රහයක් සූදානම් කිරීමට!

## අම්මාගේ පුත්‍රයන්

සති කිහිපයක් ගත වී තිබුණා
ඔහුගේ විවාහයෙන් පසු
අරුල් අයියා උදෑසන ආහාරය ගනිමින් සිටියා
'බිත්තරය හරියට බැදිලා නැහැ!'
'ඒකේ ප්‍රශ්නයක් නැහැ. මමයි ඒක බැද්දෙ!'
අලුත් බිරිඳ පිළිතුරු දුන්නා
'අම්මා ඒක මීට වඩා හොඳින් හදාවි
වේළුණු පොල් කොළවලින් විතරක්!'
'මම දන්නවා ඔයා හැමවෙලේ ම කැමති
ඇය හදන කෑමවලට කියලා!'

මෙම සංවාදයේ කේන්ද්‍රය වුණේ
ලොකු අම්මායි
මාගේ මවගේ වැඩිමහල් සහෝදරිය
ඇය ක්‍රමවලින් ඉතා සාම්ප්‍රදායිකයි
අඩුවැඩිකම් පාලනය කිරීමට දක්ෂයි
ලුණු හා සියඹලා අතර
ඇය අරුමයන් කරනවා
කුළුබඩු සමඟ

මෙයින් ස්වල්පයයි
එයින් ස්වල්පයයි
අරුල් අයියාගේ බිරිඳ
පරාජය භාරගැනීමට සූදානම් වුණේ නැහැ
'ඔයාගේ අය
වැඩියෙන් එකතු කරනවා පොල් කිරි
ලුණු හා සියඹලා!'
'අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය ඒවා, එහෙම නෙවෙයි ද?'
අරුල් අයියා ඇයව නිෂේධ කළා

පසුගිය මාසයේ
මාගේ පුතා නැවත නිවසට පැමිණියා
ඔහු ජීවත් වන්නේ කැනඩාවේ
ඔහුගේ බිරිඳ හා දරුවන් සමඟ
ඔහු මුළුතැන්ගෙයි ඉන්නවා
බිම වාඩි වී
*කූල්* රසවිඳිමින්
ඔහුගේ මව මැටි කළයෙන්
බෙදා දුන්!

මා සිතන්නේ බිරින්දෑවරුන්ට සිදුවනවා ඉවසීමට
ඉහළ ප්‍රශංසාවන්
ස්වාමිපුරුෂයන් ලබාදෙන
ඔවුන්ගේ මව්වරුන්ට
සියලු සැමියන් අම්මාගේ පුත්‍රයන්

# සිරුරේ ඇනී ඇති කටුවක්

මනෝමණී අක්කා

අපගේ අසල්වාසියකු වී සිටියා

ඇය ශරීරයෙන් කුඩා කාන්තාවක්

දරුවන්ට ප්‍රිය කළ

ඇයට දරුවන් සිටියේ නැහැ

මා පුදුම වුණා

ඇය පිළිපැදි ආකාරය

ස්කන්තසශ්ති උපවාසය

ඝන ආහාර නොමැතිව

දින සයක් පුරාවට!

මනෝ අක්කාට

විසකුරු ගෝනුස්සකු දෂ්ට කර තිබුණා

දේශීය වෛද්‍යවරයා

මූත්‍ර නිර්දේශ කර තිබුණා

(ඔබ සරල යැයි සිතනවා ඇති, නමුත් එය එසේ නො වේ!)

''කිරිදත් නො වැටුණු

දරුවකුගේ මූත්‍ර!''

මා එම විශේෂිත කාණ්ඩයට අයත් වූවා

මනෝ අක්කා, කෝප්පයක් අතැතිව

මා පසුපස ආවා

''රාසා, හොඳ ළමයා වගේ
මේකට මූත්‍ර කරන්න!''
මා අතිශයින් ලැජ්ජාශීලී
සත් හැවිරිදි දරුවෙක්
නිවස වටා මා දිවීමට පටන් ගත්තා
මනෝ අක්කා මගෙන් අයදිමින්
ප්‍රාතිහාර්ය ඖෂධය වෙනුවෙන්
මා බුරුලක් දැක්වූයේ නැහැ

කුඩා කාලයේ මතකයන්
ආවර්ජනය වන විට
මූත්‍ර සිද්ධිය පීඩා ගෙන දෙනවා
සිරුරේ ඇනී ඇති කටුවක් මෙන්

## ලොකු අප්පුගේ සාළුව

ආයුර්වේද වෛද්‍ය අණ්ණමලයි
පුරාවෘත්තයක් වුණා
යාපනයේ සුතුමලයිහි
දේශීය වෛද්‍ය පරම්පරාවේ අවසන් පුරුක

ඔහු කිසිදා මුදල් ස්පර්ශ කළේ නැහැ
රෝගියකුට මුදල් දීමට සිතුණොත්
මුදල් තැබිය හැකියි
කනප්පුව මත
වෛද්‍යවරයා එදෙස බලන්නේවත් නැහැ

අරුමයක් නැහැ
රෝගීන් පෙළ ගැසී සිටින්නට පුරුදු වුණා
ඔහුගේ බෙහෙත් ශාලාවේ
පාන්දර හතර තරම් කලියෙන්
අණ්ණමලයි වියදම් කර තිබුණා
ඔහුගේ සියලු ම පරම්පරාගත ඉතුරුම්
වෛද්‍ය සේවය මත

මැදි පනස් වියේ

මාමා ඔත්පළ වුණා

හෘදයාබාධයකින් පසුව

ලොකු අප්පු තමන්ට පවරාගත්තා

මාමා වෙනුවෙන්

බෙහෙත් ලබාගැනීමේ කාර්යය

ඔහු පාන්දරින් අවදි වන්නෙක්

හතරට නැගිට

සුතුමලයි වෙත ඇති

සැතපුම් දෙක ඇවිද යයි

එය සිකුරාදා දිනයක්

වේලාව හයයි

මා සිටියේ දත් මදිමින්

ලොකු අප්පු සතියේ බෙහෙත් රැගෙන නැවත පැමිණෙමින් සිටියා

මා පුදුම වුණා දකින්නට

පටියක අග කොටස්

ඔහුගේ 'සාළුවෙන්' එල්ලෙනවා

තවත් ළං වී බැලූ විට

මා අබිරහස විසඳා ගත්තා

අපට ඒ දිනවල විදුලි බලය තිබුණේ නැහැ

පාන්දර ජාමයේ

ඔහුට පැටලී

ලොකු අම්මාගේ සුදු යට සාය

ඔහුගේ සාළුවට

එය දමාගෙන ගොස් තිබුණා

සුතුමලයි වෙත

සහ නැවත පැමිණි මුළු ගමනේ, කිසිවකු නො දැක!

# නවෝත්පාදක

පාසල් නිවාඩු කාලය පුරාවට
මා හට ගෙදර දොරේ වැඩ රාශියක් තිබුණා
මාමාගේ මඩුවේ
සුරුට්ටු සේවකයන්ට
පත්තරය හඬ නගා කියවීම
නැතිනම් පෞරාණික ක්‍රමයට
මහාභාරතයේ එන
දිගු වැකි කියවීම

ලොකු අප්පු වඩාත් ජ්‍යේෂ්ඨ සේවකයා වූවා
දහවල් කාලය වන විට
ඔහුගේ මුඛයට විටක් කෑමේ ආසාවක් ඇති වනවා
''පුතා, ගෙදරට ගිහින් මට බුලත් ටිකක් ගෙනත් දෙන්න''
මා මෙය අසා
නිවසට දිව යනවා.
ලොකු අප්පුට දත් තිබුණේ නැහැ
ඔහු බුලත් වංගෙඩියක් භාවිත කළා විට සකසා ගන්නට
ලොකු අම්මා ඇගේ දහවල් නින්ද ලබමින් ඉන්නවා
මා බුලත් කොළ භාගයකුත්
පුවක් කැබලි කිහිපයකුත්
හුණු ස්වල්පයකුත් ගෙන
ඒවා කොටා
පූවරසු කොළයක ඔතා
ලොකු අප්පුට දී
කිට්ටි සෙල්ලම් කරන්න දිව යනවා

මා කලකිරීමෙන් සිටියේ

ලොකු අප්පු මගේ සේවය අගය නො කිරීම පිළිබඳ ව

ඉතින්, මා නව අදහසක් ක්‍රියාත්මක කළා

එය සිකුරාදා දිනයක්

ලොකු අම්මා කෝවිලට ගොස් තිබුණා

මා විට වෙනස් ආකාරයකට සැකසුවා

ඔහු එය මුවේ රුවා ගත්තා

මා එදෙස බලා සිටියා

ඇස් කොනින්

ඔහුගේ මුහුණින් නව රසයන් පිළිබිඹු වුණා

මා විට සකසා තිබුණේ සීනි හැන්දක් දමා!

ගම් දිනවල ජනප්‍රිය

'බීඩාවල' නවෝත්පාදක අයිතිය

මා හට හිමි කරගත නො හැකි ද?

# මූලයන් සොයා

කුඩා කාලයේ පටන්
ප්‍රාර්ථනා සහිත සිතිවිල්ලක් මා තුළ හොල්මන් කරමින් පවතිනවා
අභාග්‍ය සම්පන්නයි මා
මා හට ආච්චිලා සීයලා සිටියේ නැහැ
මා අදහස් කරන්නේ, ඔවුන් මියගොස් තිබුණා
ඉපදීමට කලින් මා

කුන්චි, මාගේ නැන්දා
ශරීරයෙන් කුඩා කාන්තාවක් වූවා
සහෝදරියන් පස් දෙනාගෙන් මිටි ම කෙනා
ඈ ගත කළේ හුදෙකලා දිවියක්
අහිමි වී නව දෙනෙක්
ඇය වැදූ දරුවන් දස දෙනාගෙන්

මා ඇගේ කාර්යයන් සඳහා එහෙ-මෙහෙ ගියා
එබඳු එක් ගමනක දී
සෙමින් ඇහිඳමින් කනවා
ඇගේ බත් පිඟානෙන්
''ඔබ කෙසේ ද
ඔය තරම් සෙමින් ඇහිඳ කන්නේ, කුන්චි?"

''මම මේ වගේ
පොඩි කෙල්ලෙක් කාලේ පටන්
අනෙක් හැමෝම නින්දට ගොස් තිබෙද්දීත්
මම රාත්‍රී ආහාර ගනිමින් සිටිනවා
අප්පු සුරුට්ටුවක් බොමින් ඉඳ ගන්නවා
''ඔයාගේ වෙලාව අරන් කන්න, දුවේ
මම මෙතන ඉන්නවා!"

සෙමින්, ඉතා සෙමින්
අපැහැදිලි අතීතයෙන් මතු වුණා
මාගේ සීයාගේ රූපය
මා දැක තිබූ නැති
ඡායාරූපයකින් පවා

නග්න උඩු කය සහිත හැඩි-දැඩි
අමුඩයක් ඇඳ
කෙස් පොකුරක් බැඳ
සුවඳැති සුරුට්ටුවක් බොමින්
බලා සිටිනවා ඔහුගේ කුඩා දියණිය
ආහාර ගෙන අවසන් වන තුරු!

කුන්චි ලබා දුන් අනුඡායාවෙන්
මාගේ මනස ඡායාරූපයක් සාදාගනියි
මාගේ සීයාගේ
දකින්නට බලා සිටි මා
ජීවිත කාලය ම!

# හූලන්

මැදියම් රෑ

අපගේ වටපිටාවේ කොල්ලන්

නව වසර පිළිගැනීමට තීරණය කරනවා

ඔවුන්ගේ ම ක්‍රමයට

රතිඤ්ඤා පත්තු වේ

රාත්‍රියේ නිහඬ බව බිඳ දමා

ඇස් පිස දමමින්

මා එළියට එනවා

හූලන් පේන්නට නැහැ

කුලැටි බලු විශේෂයකට ඇ අයත් වූවා

අවුරුද්දයි වයස

නම් කර ඇත්තේ ඉතිහාසගත වූ

චණ්ඩි රැජිනගේ නමින්!

අපි පඳුරු පීරා සෙව්වා

ළිං තුළට එබී බැලුවා

හූලන් හමුවුණේ නැහැ

මීට පෙර එක් වරක් ඇ අතුරුදන් වී තිබුණා

අපගේ නිවසට සොරුන් ඇතුළු වූ අවස්ථාවේ

සති දෙකක් ගත වුණා

අප බලාපොරොත්තු අතහැර සිටියේ

සිවිල් කාර්යාලයට යන්නට සිදු වුණා මා හට

දුර බැහැර ගමනකට අනුමැතිය ලබා ගැනීමට

පෝළිමේ සිටිනා විට මට

දණහිසේ කිති කැවීමක් දැනුණා

ඒ හුලන්!

මා ඇය නිවසට රැගෙන ගියා

නිවසේ සැවොම ඇය පිළිගත්තා

සිප වැළඳගැනීම් සමඟ

ආශ්චර්යයන් නැවත නැවත සිදු වන්නේ නැහැ

මෙවර අප බලා සිටියේ නිරපරාදේ

ඈ ගොස් තිබුණා

අපහසු නිසල බවක් සැරිසරනවා

අපගේ නිවස තුළ

## සූයම්වරම්

පැරණි කාලයේ

මනාලියක් තෝරාගැනීමට

යම් පරීක්ෂාවක් සම්බන්ධ වූවා

බරපතල පරීක්ෂණයක් හෝ වික්‍රමයක්

රාමා දුන්න කැඩුවා

අර්ජුන විද්දා කැරකෙන මත්ස්‍ය ජන්ත්‍රයාට

උගේ ප්‍රතිබිම්බය දෙස බලා

ජල තටාකයේ

රජවරුන් පමණක් නොව

සාමාන්‍ය වැසියන්ට පවා

මෙම පරීක්ෂාවන්ට මුහුණ දීමට සිදු වූවා

අනුමැතිය ලැබීමට පෙර

ඔවුන් කැමැති තරුණියන් කරගැනීමට

යාපනයේත් එය එසේමයි

දහනව වන සියවසේ දී

ලොකු අප්පු එසේ පැවසුවා

(මා සාමාන්‍යයෙන් ඔහු හා වාද කිරීමට යන්නේ නැහැ)

විවාහ වීමට අපේක්ෂාවෙන් සිටින තැනැත්තා

ආහාර ගත යුතුයි පිරිමින් සමග

අනාගත බිරිඳගේ පවුලේ

එතරම් සරල ද?

අභියෝගය ඇත්තේ එය තුළ ම යි

කෙසෙල් කොළය මත

පොල් ගෙඩියක්

සහ තල ස්වල්පයක්

පිසන ලද බත් අසල

අපේක්ෂකයා

බිඳිය යුතුයි පොල් ගෙඩිය

තම අතින්

ඉන්පසු තෙල් මිරිකා ගත යුතුයි

තලවලින්

පොල් කිරි සහ තල තෙල් මිශ්‍ර කොට

පිසින ලද බත්

අනෙක් පිරිමින් සමඟ බෙදා ගත යුතුයි

''මගේ කකුලෙන් අදින්න එපා''

ඔබ කියාවි

කරාතේ ක්‍රීඩකයන් දෙස බලන්න

ගඩොල් කඩනවා ඔවුන්ගේ අත්වලින්

නැතිනම් ඉන්දියානු සාධුවරු

පොල් ගෙඩි කඩනවා හිස මත තබාගෙන!

ලොකු අප්පුගේ කතාන්දරය

රැවටීමක් නො වේ, එසේ බැලූ විට!

## වෛදූරියම්

ඔහුට තිබුණේ අසාමාන්‍ය නමකි
බළලෙකුගේ ඇස - එහි වචනාර්ථය විණි
අවුරුදු පනහකට පෙර ඔහු මට මුණ ගැසුණි
දශක පහක් පියඹා ගොස් ඇති නමුත්
එනමින් මට වෙනකෙකු මුණ ගැසී නැති ය

හැමවිට ම ඔහු ඇන්දේ සුදු ය
ඔහු ව මතකයේ වූ තවත් හේතුවකි
තරුණයෝ වූ කල අප සැම
ටෙලිකොම් දෙපාර්තමේන්තුවේ
හතළිහක් පමණ වූ ඔහු
ශක්තිමත්, බුද්ධිමත් හා ක්‍රියාශීලී විය
තුන්වෙනි හේතුව මා මනසේ ඇඳී තිබේ
මේ සියල්ලට ම ඉහළින් වූයේ
පහසුවෙන් ඔහු ඉංග්‍රීසි භාවිත කළ හැටි ය
තරුණ කැලේ විනෝදාස්වාදයට
වියත් බසින් පද බඳිමින් පෑ
දත් නැති දෙඩවිල්ල
ඇද හැළෙන දියඇල්ලක් බඳු විය
අපේ වෘත්තිය සමිතියේ සභාපති වන්න
මේවා ඔහුට සුදුසුකම් වුණි
වාර්ෂික සභා රැස්වීමේ දී ඔහුගේ ක්ෂණික කෝපය පානු ඇති ය

ආරම්භයේ දී
පසෙකට වී මම සිටියෙමි
අතේ දුරින් ඔහු ඇගයුවෙමි
ළං වන්නට ලැජ්ජා වුණෙමි
සමීප වූ විටෙක
නිර්භය ව ඇසුවෙමි
''*අණ්ණා*
ඔය දත් ඔක්කොම නැතිවෙලා ද?''

ඔහුගේ ප්‍රතිචාරය ප්‍රකාශ වූයේ
වියත් පදවල ගලා යෑමකිනි
''තම්බි
මම සුභාෂ් චන්ද්‍ර බෝස්
උනන්දුවෙන් ශ්‍රවණය කළෙමි
බුරුමයේ සිට පයින් ඉන්දියාවට පෙළපාලි ගියෙමි
මගේ දත් නැති වුණි!''

තුරුණු වෛදූරියම්ගේ රුව
මනස් තිරයේ නැගුණි
අව්‍යාජ දිදුලන මැණිකක් ලෙසට

# දිව්‍ය නිරුවත

මනියම් පළපුරුදු ගොවියෙකි
දුම්කොළ වගාවේ දක්ෂයෙකි
ඔහු සකස් කළ තාවඩි විශේෂයට
ඉහළ ඉල්ලුමක් විය
දකුණේ

එහෙමයි
මනියම්ගේ දුම්කොළ
උතුරේ යාපනයෙන්
ළඟා වූයේ මාතරට

ගණපති වැසියෙකි යාපනේ
වෙළඳාම කරයි මාතර
නියෝජිත තැනකි මනියම්ගේ
කල්යත් ම ඔහුගෙන් විය හිඟ මුදල්
ප්‍රතිචාර නැති විය ලිපිවලටත්

ඉතින් මනියම් ගියා කෝච්චියෙන් මාතර
අය කරගනු පිණිස හිඟ මුදල්
අල්ලා ගනු බැරි විය ගණපති
'මම කතරගම යනවා
සල්ලි ලෑස්ති කරලා තියන්න!'
දැඩිව කියා මනියම්
පිටත් විණි කතරගම බලා

මැණික් ගඟෙන් දිය නෑ හෙතෙම

ඉවුරට පය තැබූ කල

දිටී ය නැති වග වේට්ටිය

පසුම්බිය ද අතුරුදන් ය!

ඉතින් ඔහු තම තෙත අමුඩෙනි

සිට ගත්තේ දෙවියන් ඉදිරියේ

මුරුගා දෙවියන් සිටියේ අමුඩයකිනි

මනියම් අයැදී යඃ

'දෙවියනි, නුඹටත් මෙසේ වූයේ

දුම්කොළ විකුණපු නිසා දෝ

ගණපතිට?'

# හරිත තණබිම්

මීට වසර හතළිහකට උඩ දී මුණ ගැහුණි මට ඔහු

පලාලිවල එකතු වුණා දෙන්නා ම

ගුරු අභ්‍යාසලාභීන් විදිහට

අඩි හයක උස කෙනෙක් හැටියට

කැපී පෙනුණා ඔහු ඕනෑම කැලක

මාතලේටත් පසුව ලංකාවටත්

හොකී සෙල්ලම් කළා ඔහු

විවිධ දිසාවන්ට ගියෙන් අපි

සම්බන්ධතා නැති වී ගියා

ළඟදි මම නුවර ගියා

විභාග රාජකාරිවලට

ගුරුවරියක් විය

මගේ මණ්ඩලේ මාවනැල්ලේ

දිනක් මම ඇගෙන් ඇසීමි

''ඖවුසර් මහත්තය දන්නව ද?''

ඔව් සර්, මගේ ගුරුවරයා

දැන් විශ්‍රාමිකයි

දුන්නෙමි මගෙ දූරකථන අංකය ඇයට.

පසු දින කතා කළා මට ෆවුසර්

''මට ගෙදරින් යන්න විදිහක් නෑ

බස් එකකට නගින්න!

පැයක වගේ ගමනක්

මාවනැල්ලෙන් ගන්නම්''

ඒක ආශ්චර්යවත් හමුවීමක්

විහිළු-තහළු කෙළවර

මම ෆවුසර්ට කීවෙමි

''එන අතරමග පහු කළා කඩුගන්නාව

ඒක අරුම-පුදුමයි, ත්‍රාසජනකයි!''

''ඔයා තමයි එහෙම කිව්ව දෙවෙනියා!''

''කියන්න, කවුද පළවෙනියා?''

''මම හිටියේ රට

අවුරුදු පහක් වැඩ කළා ඉරානෙ

මගෙ ලොක්කා ඉංග්‍රීසිකාරයෙක්

වැඩ ඉවර වෙලා කතාබහ කරන්න පුරුදු වෙලා හිටියෙ අපි

දවසක් මගෙන් ඇහුවා මගේ ගම ගැන

''මාවනැල්ල'' මම උත්තර දුන්නා

''එහෙ කඩුගන්නාවට ළඟයි ද?''

මම පුදුම වුණා

''සතියක් දෙකක් මම ලංකාවෙ හිටියා

කඩුගන්නාව වගේ වෙන කිසිම තැනක් නෑ''

මම නිහඬ වුණා

ඔහු කියාගෙන ගියා

''ඕන කෙනෙකුට තේරුම් ගන්න පුළුවන්

මම ඉරානෙට ආපු එක ගැන

ඒත් ඔබ කඩුගන්නාව ඇහෙන දුරින්

ඇයි දෙයියනේ ඔබ මෙහෙ ආවෙ?''

මම ආපහු ගෙදර ආවා!

ඖසර් කතාව අහවර කළා

# උතුරුකරයේ ජීවිතය

මොන ගෙදර ද විනාස කරේ
මොන පාලමට ද බෝම්බ ගැහුවේ
බිම්බෝම්බ තියෙන්නෙ මොන පාරෙද
ගොඩ ගැසූ ගොවියන්ගේ ඇටකටු මතින්
මොන කමතේ ද ගිනි ඇවිළෙන්නේ
මොන පුස්තකාලය ද විනාශ වී ඇත්තේ
මොන ශිෂ්‍යයා ද මැරී ඇත්තේ

කොයි ගැහැනිය ද වැන්දඹු
මොන දරුවා ද අනාථ
ඊයම නිහඬතාව බිඳින
විලාපයයි කෙඳිරියයි කොයි අම්මගේ ද
අපි පැමිණිලි කරන්නේ කොතැනට ද
උපන් බිමේ අපි කොයි කලක්
මෙය විඳදරාගත යුතු ද?
ඔළුව හරහා උණ්ඩයක්
මවකගේ උරහිස උන් දරුවාගේ
ඇත්තෙන් ම වීර ක්‍රියාවක්
සුදුසු පදක්කම්
නමුදු පිරිහීමට හඬ කවයි
ත්‍රස්තවාදීන් ගුවන් විදුලියෙන්
සත්‍යය ගැඹුරු නින්දේ
බොරුව රජයන අතරේ

## මිදීම

මම ආපසු ආමි

සය මසක විප්‍රවාසයෙන් පසු

පුදුමෙක මහත

නිවස සිටි විලසින්මයි, වහලය නො වෙනස්ව

ඇතැම් සොරකම් කළ දෑ හැරුණු කොට

අපේ බඩු බාහිරාදිය ප්‍රවේසම්

මර උගුල් මත කිසිවෙකු පය නො තැබුවාට

දෙවියන්ට ස්තුතියි

වටපිට බැලීමි

මට යමක් මග හැරී ඇත

ඔව්! බිලැකීගේ ප්‍රීතිමත් පිළිගැන්ම

මගේ දෑස් පාළු වුණු ගෙවතු දෙසත්

පඳුරු දෙසත් බලයි

එදවස සහ පසු දවසුත්

කළකිරුණු මා මනස ආපසු හැරෙයි

ඒ සීතල ඔක්තෝම්බරයේ හැන්දෑවට

ලිපයි ගෙයයි හැර ගිය කල මම

බාල මහලු පිරිස් සමඟ

මුරකරුවකු ලෙස සිටගෙන ඔබ

සිටියා මා අත්හැර දැමූ නිවසේ

ගියෙමි ක්ෂණික චාරිකා අභභූමියේ හිඳ

මා දුටුව කල නුඹ පිනා ගියා සතුටින්

මාව ලෙව කෑවා, අත්වලින් උදුරාගත්තා

මා ගෙනා බඩුමුට්ටු

නුඹ සන්නිවේදනය කළා මට

වෙන්වීමේ වේදනාව

තුන්වැනි වතාවට නුඹ මා පසුපස ආවා

නොහොබිනා ලෙස මා හද සොරකම් කරමින්

මම නුඹ එලෙව්වා

ගල් ගැහුවා!

අද

මතකයන් මා වටා හොල්මන් කරයි

බලා සිටිමි මම

මිනිසුන්ගෙන් ඉවත් ව අයාලේ යන බල්ලන් දෙස

ෂෙල් වෙඩි ප්‍රහාර සහ වෙඩි තැබීම්

ඇසුණි පාළුකරයෙන්

ඔබ එහි නැත

නමුත් ඔබේ මතකය මා වටා හොල්මන් කරයි

නුඹ මළ වග සිතෙන කල

මා අතැර ගිය නිවස රැකීම

වරදක් යැයි සිතෙයි

ලැජ්ජා වෙමි

මගේ බියගුලුකම ගැන

මා හානියට පත් නිවස

තක්සේරු කරන ලෙසත්

නැති වූ දේපළ

අතුරුදන් වූ සාමාජිකයන්

අවතැන් වූ පුද්ගලයන්

මගේ ශේෂ පත්‍රයේ

හරයක් ලෙසත් පෙන්වයි

බංකොලොත්

මට ඔබෙන් කපා හැරීමක් ඉල්ලා සිටිය හැකිමුදු

ඔබ එහි නැත

ඔබේ මතකය පමණකි

තවමත් එය මා හොල්මන් කරයි

## පුර පෝයක සිතුවිලි

(ඉන්දියානු සාම සාධක හමුදාව පිටත්ව යෑමට ආසන්න දිනක රචනා කරන ලදි)

කිරි දියර ගලයි පුර පසළොස්වක සඳෙන්

සිය දහසක් සිතුවිලි

මනස් සයුරේ සැඩපහරේ

මේ වගේ ම වෙලාවක පෙර දින

මඳ සුළඟින් ලාලිත විය පොල් ගස්

සඳ එළියෙන් සැනසුණි

පාවී යන නිහඬ පවනේ මිහිරි ස්වර වාදනය වුණි

අහස තිබුණේ නිල් වියනක් මෙන් විහිදී ය

ඒ යටින් අපි තෙත් වැල්ලේ ඇවිද ගියෙමු

තාරකාවන් රටා අඳිනා සේ අත් පැටලුවෙමු

පිදුරු සෙවිලි කළ පැල්පතේ සිටිය දී

ගීයකට බෙර වැනුමක්

මැදියම් රැයේ වෙන් වුණි

කිරි වත්කළ ද පුරහඳ

තුන් මසකින් වැස්සක් ආවේ නැති ය

චණ්ඩ හිරු රැසින් පුලුස්සා දමන්නා වැනිය බෝග

සහ තුරු මුදුන්

අපේ බෙලි මිරිකෙයි

අපි නිෂ්ඵලව බලා සිටිමු

දැත් අවැසිය හාරන්න

ජලය සොයන්නට

අපි අයැදීමු

තරුණයෝ සමහරක් පිළිතුරු දී සන්නද්ධව ආහ

'වතුර ගැටෙනකම් අපි විවේක නොගන්නෙමු' කීහ

අලවංගු හා ගල්කටු රැගෙනයි අසල්වාසීන් පැමිණියේ

ඇතැම්හු ඔවුන්ට කෑම එවූහ

මෙතරම් වැඩෙහි යෙදිය හැක්කේ කාට ද?

අපි සිතුවෙමු

වීදි තොරණින් සරසා

මල්මාලා දමා ඔවුන් පිළිගත්තෙමු

බෙර හඬ මැද්දෙන්

ආකාසයෙන් ලද පිරිසක් සේ සිතා

රිය පෙරහැරකින් ගෙන ගියෙමු

මසකට වඩා දැහැනක අපි පසු වීමු

නමුත් දිනෙක දෙවිවරු යක්ෂයන් බවට පත් වූහ

නිජබිමක් පැතූ අපට කළෝය හිරිහැර

විනාශ කළහ අපේ නිවෙස්

වෙනස් වුණු දෙවියන් සතුටු කරන්න ද සිදු විය

කුකුළන් සහ එළුවන්ගෙන්

අබරණ සහ ගෘහයන්ගෙන්

වයින් සහ කාන්තාවන්ගෙන්

වතුර නොව ආවේ කඳුළු ය

නීති විරෝධී ළිඳක් හැරීමට ගත් උත්සාහය නිසා

තරුණයන් දඩයම් කරනු ලැබිණි

මුසාබස් තොගයකට විශ්වාසය දෙන්න
ඔවුහු හැම තැනක ම ගියහ

යක්ෂයින් උසි ගන්වන ලදි
කොල්ලකෑමට හොරකමට සහ පහරන්න
යත්න දැරීමු නමදින්න අඩ හඳ
මුරුංගා තුරු අතරින්
නමුදු අපි දුටුවේ
සිව්වන දිනයේ අඩ සඳයි
අපි හැඬීමු, වැලපීමු

ඉන් පසු දිනක සුළි කුණාටුව මුරුංගා ගස උදුරා දැමීය
භූතයන් අතුරුදන් විය
තරුණයන් නො සැලුණි
යළිත් ගල් පිපිරීම ඇරඹුණි

සමහරු කළෝය පැමිණිලි
නින්දට බාධා වූවා කියා
ඔවුහු පැවසූහ.
''අපිට නොකියා?
ව්‍යාපාර කරන්න
ඔය විකාරවලට ඉඩ දෙන්න බැහැ!''
එබැවින් ගඟ අවහිර විණි
ළිං සිඳුණි
වියළී ගිය බෝග සහ දැවී යන වතු
ඉරිතැලුණු වෙහෙරවල්
සහ විනාස වුණු නිවෙස්
තල් ගස පුපුරවා ද?

විලාපයකට හෝ වැලපීමකට කාලය නො වෙයි මේ
කිරි දියර ගලයි පුර පසළොස්වක සඳෙන්

තල් ගස නැවත දළුලනු ඇතිය
සෘජුව වැඩෙන්නට
වෙන දා මෙන් ආවේගයෙන්
කිසිවිට දණ නොනැමෙන
පීඩනය අබිමුව

බෙර වැනුමට ඉඩක් දෙන්න
දෙපළු කරන්නට මැදියම් රැය
වස්දඬු රිද්මයට ඉඩ දෙන්න
කන්වලට මධු රස වක්කරන්න
අවසන අපිට හැකි වේවි ඇවිදින්න අපේ පාද සඟවමින්
යළිත් වරක් තෙත වැලි මත
කිරි දියර ගලයි පුර පසළොස්වක සඳෙන්

# කර්ම

යුද්ධය ජීවිතය මූසල කළේය
විදුලියක් නැති
ඉන්ධන මත තහනමක් ඇති
බස් තුදුසක් පාරේ
බයිසිකලය විය
එක ම ප්‍රවාහන මාර්ගේ

අටට කලියෙන්
ශිවාට සිය දරුවන් පාසලට ගෙන යන්න සිදු විණි
පුතයි දුවයි
විශ්වවිද්‍යාලයට ද වාර්තා කළ යුතු ය
කථිකාචාර්යවරයෙක් විය ඔහු
හනික යන කල පාසලට ඔහු
සයිකලේ පිටුපස අසුනෙ තබන් සිය දරුවන්
ඔහුගේ ප්‍රධානියා, මහාචාර්යතුමා
යන මඟ සිටිනු පෙනෙයි
ශිවා ඔහුගේ දිවා ආහාර වෙලාව යොදා ගත්තා
රැගෙන යන්නට ඔහුගේ දරුවන්
පාසල ඇරී බලා සිටින
ප්‍රධානියා ශිවාට බලපෑම් කළා

''පෞද්ගලික දින චර්යාව

ඔබේ රැකියාවට බලපෑම් නොකළ යුතුයි''

''ඒත් සර්,

මම වෙලාවට වැඩට එනවා ඔබ දකිනවා නේද?''

අමනාප නොවෙමින්

මහාචාර්යවරයා වෙනස් කළා කාලසටහන

දැන් ශිවාට වැඩ පැවරුණා

එකේ ඉඳන් දෙක දක්වා

ළමයින්ට සිදු වුණා බලා සිටින්න

සියල්ලන් ම නික්මුණු පසුවත්

ඔවුන් හිටියේ නිකරුණේ

බඩගින්නේ

ජීවිතය ඔවුනට දුෂ්කර විය

කරුණාවන්ත ගුරුවරයෙක්

නිකරුණේ උන් ඔවුන් දැක

ලබා දුණි අමතර වැඩ

ඔවුන් ඉතා හොඳින් වැඩ කළා

වෛද්‍ය විද්‍යාලයටත් ඇතුළු වුණා

දෙන්නා ම දැන් වෛද්‍යවරු

එපමණක් නො වේ

මහාචාර්යවරයාට පුතෙකු විය

මොට්ටයෙක් වුණු

දෙවියන්ගෙ ඇඹරුම සෙමින් නමුත් හොඳින් සිදු වේ!

# අපේ කාලය පිළිබඳ ප්‍රවේශම් වන්න
# (කෙටි කවි හතක්)

**1. තල්ගස**

සන තල් ගස් අරඹ

ඉහළට ම නඟිමින්

රකියි ඔබ ව

දැඩි ෂෙල් වෙඩි ප්‍රහාර මැද

**2. බල්ලන්**

ඔබ පලා ගියේ නැත

එසඳ අපි වගේ

අද පවා ඔබ බුරයි අනවරතයෙන්

ආගන්තුක අඩි ශබ්දයට

කෙසේ ද ඒ?

අප තුළ නැති දේශප්‍රේමය ද

ඔබව පොළඹවන්නේ?

**3. ආත්මාර්ථකාමීත්වය**

ඔබේ ට්‍රක් රථය හැම විට

පසු කරන කල අපේ ගම

ඔබ වෙනුවෙන් මම යාච්ඤා කරමි

ඔබ වෙනුවෙන් පමණක් නො වේ

මා වෙනුවෙනුත්!

**4. මුහුණු**

මොන පවක් ද ඔවුන් කර ඇත්තේ

සුන් වුණු අපේක්ෂාවන්, බිය සහ අනියත බව

ඒ මුහුණුවල ලියා ඇත

කඳවුරු පසු කරන අතරතුර මම

උදේ හවස

ඔවුන් දකිමි

දුකිත බවින් පීඩිත මවුන්

ඉරණම ගැන තැවුලෙන්

තම දරුවන්ගේ

**5. මහලු වීම**

ඔබ මුලින් පෙනී සිටි කල

මම බිය වුණෙමි

පිළිකුල් කෙළෙමි

දිවා-රෑ වැඩ කළේ

නෙරපන්න ඔබ

ඒත් ඔබ කාරුණිකයි, උපකාරශීලියි

සලසමින් පහසු යාම්-ඊම්වලට

මුරපොළ සහ බාධක මැදින්

**6. එල්ලුම් ගහ**

"මේක තමයි ලන්දේසි බලකොටුව

අන්න අරක දිය අගල"

ගුරුතුමා අපේ කී ය

"අර මොකක්ද සර්?"

"අපරාධකාරයෝ එල්ලපු එල්ලුම් ගහ!"

කොඳුඇට පෙළ මගේ සැලුණි
මගේ හීනයේ එල්ලී වැනෙන සිරුරකි

නමුත් අද
එල්ලුම් ගස් වුණු පහන් කණු දැක
මම නිදි නැති රැයවල් ගත කරමි

**7. අප්පු හෙවත් වීරයා**

අප්පු ඒකාන්තයෙන් ම වීරයෙකි
හැටවසක් ගත වී ඇතත් ඔහු තාම දරදඬුයි
යුද පෙරමුණට යා හැකි ගතියකි
මට අමතකයි
ඔහුගේ වැඩිමහල් පුත් ජර්මනියේ
අනෙකා කැනඩාවේ
දුව ඉන්නේ නෝර්වේ
අප්පුගේ සාක්කුව වේලාපත්කඩවලින් ඉලිප්පිලා
ගැහැනු-පිරිමි ළමයින් ගළපන
හැටේ අප්පු ඒකාන්තයෙන් ම වීරයෙකි

# අතරින් බලන්න

බලන්න අත්බෑග් පෙළ
විලාසිතාවක සංකේත!
සමහරක් වර්ග කළ හැකිය
''අතරින් බලන්න''
ඒවා විවෘත කිරීම අවශ්‍ය නැත
දෘශ්‍යමානය අවැසි දෑ
ප්‍රමාද නොවී මුරපොළක් හරහා
ඔබට ගමන් කළ හැකි ය

අපිත් ඇඳිය යුතු නො වෙමු ද?
අතරින් පෙනෙන ඇඳුම්
අපේ ගමන පහසු වන්නට
මුරපොළක් හරහා?
අපේ සාක්කු කියාවි
ටිකට් සහ ටැග් ගැන
කිසිවක් නොවනු ඇත
සොයාබලන්නට හෝ අතපත ගෑමට
තට්ටු කරන්නට හෝ ලාලනයට
සෙවීමකට හෝ අනවසර ඇතුළු වීමකට
මගේ පුද්ගලයා තුළට!

මලූ තුළින් බලන්නා සේ

ඇඳුම් හරහා බලන්නා සේ

අපි හැකි නම් ආශිර්වාද කරන්නට

හදවතින් බලන්න

එය කොතරම් උදාර වනු ඇති ද!

ඔබේ හදවතට කිසිවක් සඟවන්නට නැතිනම්

එය නො වේ ද සියලු අසත්‍යයේ

රැවටීමේ සහ කුහක බවේ අවසානය?

එසේ නොවේ නම්

ආදම් සහ ඒවා සේ

මිනිසා ලැජ්ජාට පත් වී

සඟවයි ද තම නිරුවත?

## දණ්ඩනය

වට කරං නීති බලාත්මක කරන්නන්
පොලු තුවක්කුවලින් සන්නද්ධ ව
පරිලෝකනය කරයි වැටවල් සහ පඳුරු
තම තමන්ගේ ඇස්වලින්

නිවසක ඉදිරිපස ඇති
හරිත පැහැ තුරුපත්
ඔවුන්ගේ ඇස් රිද්දයි

ඒයි! කවුද ඉන්නෙ?
පැල්පතෙන් මතුවෙයි මහලු මිනිසෙක්
"ඇයි උඹ කොළ අතු කැපුවේ නැත්තෙ?"
"අධිරුධිර පීඩනය, දියවැඩියාව, ඇදුම!"
"ගෙදර වෙන කවුරුවත් නැද්ද?"
"නැහැ. මම තනියම!"
කුලීකාරයෙක් ව හොයාගෙන
"සුදු කොඩියක් දානවා
තේරුණා ද?"
"ඔව් සර්. ඔව්!"

ඊළඟ සතියේ
පෙළ යන අතර දුටුවේ
කොළ පැහැ තුරුපත්
වෙන දා මෙන් නැවුම්

කෝප්‍රල්කරුවකු ඇදගෙන එයි මහල්ලා

ගෙනත් පමුණුවයි සැරයන්ට

"මම කිව්වේ නැද්ද කුලීකාරයෙක් හොයාගෙන

මේ කොළ අතු ටික කපන්න කියලා?"

"කුලියට ගත්තා මං එකෙක්

ඒත් ආවේ නැහැ"

"ඇයි ඒ?"

''මනුස්සයාගෙ සලාකෙ ගන්න ගිහිල්ලා''

''ඇයි ඔහේ සුදු කොඩියක් ඉස්සුවේ නැත්තෙ?''

''මම ටවුමට ගියා ඇඳුම් ගන්න!

බිම් බෝම්බයක් පිපිරුවා

කඩ සියල්ල වැහුවා''

''මූ කතා කරන්නෙ ත්‍රස්තවාදියක් වගේ''

සොල්දාදුවකු බාධා කළේ ය

සංඥා කළා සැරයන් තෙමේ කෝප්‍රල්ට

මහලු මිනිසාට ඔහු පහර දුන්නා

ත්‍රිශූලය සලිත විය

*බෝධිය පැද්දුණි*

කුරුසය වෙව්ලිණි

## හංවඩු ගැසීම

තඹලගමුව සිට
ගොන් කරත්තයකින්
වන මැදින් ඔබ ගියොතින්
අල්ලෙයි දෙසට
ළඟා වෙයි අඩ දිනකින් තවලමට
සරුසාර හරිත කෙත් වතු
මහවැලියේ අතුගඟක් අයිනේ
සිය තේජසින් සොබාදහම
ඔබව ගොළු කරාවි
නැත්නම් කවි ගිනි පුපුරක් දල්වාවි

පොන්නම්බලම්ගේ මී හරක් නඩය
තබා සිටියේ තවලමේ
කුලියට ගත් මිනිසෙකු විය ඔහුට
බලා-කියා ගනු පිණිස මී හරක්
ඔහුගේ මිශ්‍ර වුණු බසට (සිංහල සහ දෙමළ) කන් දීම
සැබෑ සොම්නසක් විය
අවුරුද්දකට වතාවක්

පොන්නර් යයි තවලම්
පිරිවර සමඟින් ඔහුගේ
සතියක් බැඳ එහි කඳවුරු
ගණන් බලයි-ගසයි හන
ගිය වසර පුරා ආ
වසූ පැටවුන්ට

පිරිස ලබා ගනියි කළමනා
ඉවුම්-පිහුම් බඩු බාහිර
පොලුයි හුළං විස්කෝතුයි
සම්මත වුණු උදේ කෑම
කිරි ගලා ගියා ඔහේ

වේලායුදම් යයි දඩයමේ
ගොස් ගෙනෙයි මස්
සතිය අවසන
යළි ආ කරත්ත මත පැටවෙයි
වියළි මසුයි
මී පැණි කිරි
කාලයේ රියසක හැරුණි
විනාශ විය තඹලගමුව යුද්ධයෙන්
වේලායුදම් කෙරුණි දඩයම්
කලෙක වසූ පැටවුන් හන ගැසූ මිනිසුන් ම
සිටියා ගසාගෙන තමන් ව හංවඩු

# මයිලර්

අපි හිටියේ අට වසරේ

අඟහරුවාදා බ්‍රහස්පතින්දා

අපිට තිබුණේ ශාරීරික පුහුණුව

අන්තිම කාලච්ඡේදේ

පෙළ ගස්වා අපිව

අරං යනවා පිට්ටනියට මයිලර්

විසල් සරඹ

ගිනි ගහන අව් රශ්මියේ

ගහද්දි විසිල්

නැමෙමු අපි

පැනිලි එක්ක

බඩ ගෑවිලි

පිම්මෙ දිවිලි

කළේ ම අපි ශාප

තිත්ත වුණා පී.ටී[2]

ඒ මීට දශක පහකට කලින්

මයිලර් අද නැත

දැන් මට වැටහෙයි

ඔහු අනාගත වක්තෘවරයෙක්

සිතමි ඔහු ගැන දිනපතා

පාර මාරුවක දී

සොල්දාදු විසිල් හඬ ඇසෙද්දී

නැමෙමි

පනිමි

බඩගාගෙන

පිම්මෙ දුවමි!

උඹට දැන් හැටත් පැනලා

මෙච්චර දස්කම්

කොහොම ද හාං-බාං කරන්නෙ?

සූරි අසයි

අසරණයා

දැන් ඔහුට හතළිහක්

වාසනාවන්ත වුණේ නෑ ඔහු

මයිලර් බඳු

පී.ටී. මාස්ටර් කෙනෙක් ලබන්න

[2]පී.ටී – Physical Training

# අන්තිම පලාලය

බොහෝ සන්නද්ධ කණ්ඩායම්

භූමියේ විය එදවස

තිල්ලෙයි ව්‍යාපාරිකයෙකි

යහමින් සරුසාර

"කොල්ලන්" ළඟා වෙයි

අතමාරුවලට

ඔහු හරි ම ලිබරල්

ඒ වගේ ම අපක්ෂපාතියි

සියලු සනුහර බැඳී සිටියා ඔහුට

"උන් සටන් කරන්නෙ අරමුණකට

වෙන කොහෙ කියා යන්න ද?"

තිල්ලෙයි සානුකම්පිත වුණා හැම විට

සටන්කාමීන්ට උදව් කළා ඔහු

කරුණාවෙන් මිල-මුදලින්

පාවිච්චියට ගෙයකුත්

ඔහුට වුණු තරුණයන්ගේ ගෞරවය

දවස ගාණෙ ගියා ඉහළ

එක්තරා දවසක

මම කතා කළා තිල්ලෙයිට

හමුවුණේ මට

කළකිරුණු ඔහු

වචනයක්වත් නො දෙඩූ

පවුල ගැන

ව්‍යාපාර ගැන

රට ගැන

දේශපාලනය ගැන

නිකම්ම මිමුණුවේ "හ්ම්...!"

කුමක් විණි ද මේ මිනිසාට?

මම කල්පනා කළෙමි

යකඩ යෂ්ටියක් තිබුණි නිකරුණේ

කම්මල මත තබා අපි

තැළුවෙමු

නැව්වෙමු

හැඩ කළෙමු

එය ත්‍රිශූලයකට

දැන් එය ම දෙයි නියෝග

සැවුලන් සහ එළුවන්

පූජාවන් ලෙස තබනට

පෙර දා රාත්‍රියේ

යුද මූළ

රැගෙන ගොස් තිබුණා

පට්ටලය

ඔහුගේ එක ම ජීවන මාර්ගය

## විවාහයේ පරමානන්දය

කරුණාවන්ත

සන්සුන්

අහිංසකයකු විය

මානික්කම්

ඔහුගේ නළල මත

පෙනෙන කැළල ඇති වූ හැටි

අසන්නට තරම් දිරියක් ලද දා

මා ලද පිළිතුර

''මන්නෙකට කැපුණා''

''කොහොම ද කැපුණේ? කවුද කැපුවේ?''

සංකරන්, වැටක අවුලක්

මිනිහ පිහියක් ගත්ත

මං පොල්ලක් ගත්තා

මගේ ගෑනි දුවගෙන ආව

ඉතිං

ගෑනි මාව බදාගත්ත

මට හෙලවෙන්නවත් බැරි වුණා

සංකරන් කෙටුව මගෙ නළලට

ගෑනි කාගෙ පැත්ත ද ගත්තෙ

අද වෙනකනුත් මං දන්නෙ නෑ

සංකරන් යන්න ගියා

නළල අත ගගා

***ලේඛක දයා දිසානායක මහතා විසින් පරිවර්තනය කරන ලද කවියකි.***



සෝමසුන්දරම්පිල්ලෙයි පද්මනාදන් හෙවත් 'සෝපා' උපත ලබන්නේ 1939 වර්ෂයේ යාපනයේ කොකුවිල්හි දී ය. යාපනය විශ්වවිද්‍යාලයෙන් සිය ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය ලබන ඔහු ගුරුවරයකු ලෙසත්, විදුහල්පතිවරයකු ලෙසත්, කථිකාචාර්යවරයකු ලෙසත් සේවය කර තිබේ. පද්‍ය රචනා මෙන් ම පරිවර්තකයකු ලෙස ද සිය ලේඛන කටයුතු සිදු කළ ඔහුගේ නිර්මාණ රාජ්‍ය සාහිත්‍ය සම්මානයන්ගෙන් ද පිදුම් ලැබ තිබේ.

# යාපනයෙන් ඇසුණු කවි

සෝමසුන්දරම්පිල්ලෙයි පද්මනාදන්ගේ දෙමළ කවි විසිහයක සිංහල පරිවර්තනය

**150/-**

**ප්‍රකාශනය**
**මානව විද්‍යා අධ්‍යයනාංශය**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
http://fhss.sjp.ac.lk/anth/

ISBN 978-624-5703-21-0

